## විටෙක නරක කෙනෙක්
## තවත් විටෙක හොඳ කෙනෙක් කරන

# සුසන්ධීකරණ සංකල්පය

## දේවත්ව සංකල්පය තුළදී යෙදෙන අයුරු

ලෝකේශ්වරී සඳමාලී කරුණාරත්න
පේරාදෙණිය



නිතර ඇහෙන වචනයක් නොවුනත් " සුසන්ධීකරණය" කියන්නේ අපේ ජීවිතවලට බොහොම සමීප සංකල්පයක්.

"සු" කියන්නේ " මනා, යහපත්, අතිශය , ඉතා" වගේ තේරුමක් දෙන උපසර්ගයක්.

"සන්ධි" කියන්නේ "ගැලපීම, සම්බන්ධය" වගේ තේරුම් දෙන පදයක්.

කරණය" තුළින් "කිරීම" කියන අර්ථය ගම්‍ය වෙනවා.

මේ විදියට බලද්දී සුසන්ධීකරණය කියන යෙදුමේ වාක්‍යාර්ථය අපිට මෙහෙම ගලපා ගන්න පුලුවන්.

සු - සන්ධි - කරණය
මනා කොට - ගලපා ගැනීම

තේරුම එහෙමයි කියමුකෝ. ඉතිං ඔය ගැලපීම කරන්නේ මොන මොන අංශ අතරද කියන එක තමයි අපිට ඊළඟට ඇතිවෙන ගැටලුව. "වෙන් වෙන්ව පවතින අර්ථ දෙකක් මනා ලෙස ගැලපීම" කියන තේරුමෙන් තමයි සාහිත්‍යයේදී " සුසන්ධීකරණය" හඳුන්වලා දීලා තියෙන්නේ. වෙන් වෙන්ව පවතින අර්ථ කිව්වට මේ අර්ථ දෙකේ විශේෂත්වයක් තියෙනවා. ඒ තමයි මේ අර්ථ දෙක එකිනෙකට පරස්පර විරෝධී වීම.

සරලින්ම කියනවා නම්, අයහපත් ක්‍රියාවල නිරතවීම නිසා අයහපත් ලෙස හැඳින්විය යුතු පුද්ගලයෙකුට, යහපත් ප්‍රතිරූපයක් සහිත අර්ථකථනයක් ලබා දීම තමයි සුසන්ධීකරණයේදී සිදුවෙන්නේ. නපුරුකම්, කෲරකම්, සැහැසිකම් වගේ නොපනත්කම්වල නිරත වූ කෙනෙක්ට වුනත් සුදනකමක් ආරෝපණය කිරීම සුසන්ධීකරණයෙන් සිදුවෙනවා. බොහෝ විට දහසක් නුගුණ මැද්දේ වුණත් මේ චරිතය තුළ තිබුණු එක් යහපත් ගුණයක් නිසාම මේ සුදන ප්‍රතිරූපය ආරෝපණය වෙන්නත් පුලුවන්.

සුසන්ධීකරණ සංකල්පය ජනශ්‍රැතියට ඇතුළත් වෙලා තියෙන්නේ මිනිස් හිතේ ස්වභාවික චර්යාව නිසාමද කියලත් අපට හිතෙනවා. බොහෝමයක් දෙනා ජීවත් වෙන්නේ තමන් මැරෙන බව අමතක වෙලා වගේනේ. සණ්ඩු"දබර වෙනවා, විවේචනය කර ගන්නවා, අනුන් හෙළා දකිනවා. නමුත් අන්තිමේදී එක්කෙනෙක් මැරුණාම, ඒ මැරුණු කෙනාගෙ එකම එක යහපත් ගති ගුණයක් ගැන හරි උලුප්පලා ගුණ කථන කරනවා.

සමහර රජවරු ඉක්මණින්ම කුපිත වුණු අය; මහජනයාට අප්‍රමාණ තාඩන පීඩන දුන්න අය. ඇතැම් අය ධනවතුන්ගේ වස්තුව කොල්ල කාලා එයින් කොටසක් දුගීන්ට බෙදා දුන්නා. ඒත් අර්ථකථනකරුවා මේ කලු පැල්ලම් හැම එකක්ම පසෙකට දාලා, මේ චරිතවලට වීරත්වයක් ආරෝපණය කරලා, කතාව ඉවර කරනවා. ඒ තමයි ජනශ්‍රැතිය තුළින් විද්‍යමාන වන සුසන්ධිකරණයේ සලකුණ.

සිංහල සමාජය තුළත් දහස් සංඛ්‍යාත ජනයාගේ ගෞරවාදරයෙන් වන්දනාවට පාත්‍රවන දෙවි දේවතාවන්ගේ උත්පත්ති කථා අධ්‍යනය කරද්දීත් අපට සුසන්ධීකරණ න්‍යායේ භාවිතය ගැන සාධක පැහැදිලිව දැකගන්න පුලුවන්.

- කම්බිලි දෙවි
- කඩවර දෙවි
- ගනේශ/ ගණපති දෙවි
- විහිෂණ දෙවි
- රිට්ටා දේවී
- පත්තිනි දේවතාවිය

මේ අතරින් සුවිශේෂී චරිත.

මුදියන්සේ දිසානායකයන් නර්තන වාක් කෝෂය කෘතියේදී "දේව" සංකල්පය නිර්වචනය කරන්නේ ශ්‍රී ලංකාවේ ජන විඥාණය ගැනත් අවධානය යොමු කරමින්.

"දේව " "දේව" යන්න "යක්" යන්නට වඩා උසස් තත්ත්වයන් උසුලන කොට්ඨාශයක් හඟවන වචනයක් ලෙසට භාවිත කෙරේ. යකුන්ට වරම් දෙන්නේ දෙවියන්ය. ඒ නිසා යකුන්ට වඩා දෙවියන් තත්ත්වයෙන් ඉහළය. මිනිසුන්ට යහපතක් දෙවියන්ගෙන් සිදු වෙතැයි යන ගැමියන්ගේ විශ්වාසයයි. එනම් යකුන්ගෙන් පැමිණෙන රෝ දුක් දුරු කර සැපත ළඟා කර දෙන්නේ දෙවියන් විසින් යැයි අදහන, විශ්වාස කරන බැවිනි."

කොහොම වුණත් "දේව" කියන පදයේ ගැබ් වෙන්නේ "යහපත" කියන අර්ථය බව අපිට මේ නිර්වචනයෙන් ගම්‍ය වෙනවා. ඒත් උප්පත්ති කථාවල සඳහන් වෙන විස්තරවලට අනුව යහපත් ක්‍රියාවලට විතරක් නෙවෙයි, අයහපත් ක්‍රියාවල යෙදුණු පුද්ගලයන්වත් පසු කාලෙදී සාධුත්වය හා සම්බන්ධ වුණු දේව සංකල්පය එක්ක ගලපන ආකාරය අපිට පෙන්නුම් වෙනවා.

### කම්බිලි දේවතාවා

කම්බිලි දෙවි ඇදහීම මුල් බැස ගෙන තියෙන්නේ උතුරු මැද පළාතේ. කම්බිලි තුන් තට්ටුවට ඒ ඒ නම් ලැබෙන්න හේතුත් පුරාණෝක්තිවලදී කියවෙනවා.

- කළු කම්බිලි- ජවි වර්ණය තනි කළු නිසා
- හැඩ කම්බිලි - ජවි වර්ණය ලා කහ නිසා
- රත්න කම්බිලි - ජවි වර්ණය රත්‍රං පාට නිසා

කම්බිලි තුන් කට්ටුව උපත ලැබුවේ වෙළඹකටයි පඬුවස්දෙව් රජුටයි දාව. චේතිය කියන වෙළඹ එක්ක ගිය හැම යුද්ධයකදීම රජතුමා ජය ගත්තාලු. කල් යනකොට වෙළඹට රජතුමා ගැන පිළිබඳ හිතක් පහළ වෙලා කම්බිලි තුන් කට්ටුව දරුවන් තුන් දෙනෙක් විදියට උපත ලැබුවලු.

කම්බිලි එක්ක සම්බන්ධ වෙලා තියෙන පුරාණෝක්ති අනුව මේ චරිතය ඉතාම තද ගතිගුණ තියෙන, අකාරුණික ජීවිතයක් ගත

***කෝවලන් තමන්ගේ බිරිඳ කණ්ණගී අතහැර දාලා නිළියක් එක්ක ජීවත් වෙන්න යනවා. මේ නාටිකාංගනාව එක්ක විනෝදකාමී ජිවිතයක් ගතකළත් අන්තිමේදී නාස්තිය නිසාම මුදල් සේරම ඉවර වෙනවා. නිළියත් කෝවලන්ගෙන් වෙන් වෙලා යනවා.***

කළ කෙනෙක්. ඉන්දියාවේ ඉඳලා තම්මැන්නාවට ආ ගමන්ම මේ රටේ හිටපු ද්‍රවිඩ ජාතිකයෙක් කම්බිලි තල් ගසක හිර කරලා බැන්දා. ඒත් කොහොමින් කොහොමින් හරි එතනින් ගැලවිලා ගිය කම්බිලි කුරුණෑගල මල්බලිකළ ගමේ පදිංචි වුණා. ඒත් ඔහුගේ අරමුණ වුනේ කතරගම දෙවියන් වෙත යන එක. එක වතාවක් ස්වාමීන් වහන්සේලා හැට නමක් පිරිත් කියමින් සිටි තැනකට නරක් වුන මිනියක් ගෙනවිත් දාලා, භික්ෂුන් හැට නමගේ හිස් වෙන් කරන්න කම්බිලිට හිතුනා. පිරිත් මණ්ඩපය පිරිත් නූල්වලින් වට කරලා ආරක්ෂාව සලසන චාරිත්‍රය ඇතිවුණේ කම්බිලි නිසා කියලා ජනශ්‍රැතියේ සඳහන් වෙන්නේ එහෙමයි.

කම්බිලිගේ තද බව, මුරණ්ඩුකම වගේම වෛරී ස්වභාවය පෙන්වන තවත් එක් අවස්ථාවක් තමයි කඳුඩබොඩගම වෙද පරම්පරාව සම්බන්ධ සිදුවීම්. කම්බිලි භික්ෂුන්ට කරපු හිරිහැරයට පාඩමක් ඉගැන්වීමට හිතපු කඳුඩබොඩගම මහ වෙදරාළ, තමන්ට හසල දැනුමක් තිබුණු යක්ෂ, ප්‍රේත, භූත වගේ අද්භූත පිරිස් හැසිරවීමේ ශිල්පයේ බලයෙන් කම්බිලි යක්ෂයා ද බැඳගෙන වැඩ ගත්තා.

ජීවම් කරපු කටුවක් ඔලුවේ ගැහීමෙන් කම්බිලිව අවනත කර ගන්න වෙදරාළට පුලුවන් වුණා. එක දවසක් දර හොයාගෙන එන්නට කැලේට ගිය වෙදරාළට තමන්ගේ ඔලුවේ කටුවක් ඇණුනා වගේ දැනුනා. ගෙදර ආ ගමන්ම කටුව ඉවත් කරන්න කියලා හාමිනේට කිව්වා. මන්ත්‍ර ගුරුකම් ගැන නොදන්න හාමිනේ කම්බිලිව බැඳ ගන්නට ජීවම් කරලා ඇණ ගෙන තිබුණු කටුව ගැලෙව්වා. ඒ මොහොතෙම අවනතකම කම්බිලිගෙන් තුරන්

ඉස්සර කාලේ ලංකාවේ තිබුණේ කෘෂිකර්මයම පෙරදැරි වුණු ආර්ථික හා සමාජ රටාවක්. යම් කෙනෙක්ට සමාජය වෙනුවෙන් කරන්න පුලුවන් ලොකුම සමාජ සේවය වැවක් හදවලා දෙන එක කියලා තමයි ඒ කාලේ පිළිගැනීම වුණේ. ඒ වගේම සමාජයෙනුත් මේ සමාජ සත්කාරය කරපු පුද්ගලයාට ගෞරව බහුමාන පිරිනැමුනා. තමන්ගේ පලාතට වැවක් හදවලා දුන්නු මේ සිටුවරයාටත් දේවත්වයක් ආරෝපණය වුණු එක සාමාන්‍ය සිදුවීමක්.

තද පෑවිල්ල තිබුණු කාලෙක වැස්ස ලබා ගන්න එක අරමුණු කරගෙන පිරිත් සජ්ඣායනයට වැඩම කරපු භික්ෂූන් හිමි හැට නමක් අතරින් එක් භික්ෂූන් වහන්සේ නමක් කරපු ක්‍රියාවකින් ප්‍රකෝපයට පත්වුණු සිටුතුමා, භික්ෂූන් හැට නමගේම බෙලි කපලා වැව් වතුරට දැම්මාලු. ඉතිං සිටුතුමා රැස් කර ගත්ත පාපය සුළු පටුද? ඒ විතරක්ද! සිටුතුමාගේ අවසන් චේතනාවත් හරිම දුෂ්ඨ චේතනාවක්. අනුරින් ඉන්දිකාගේ "කනදරා කෝරලයේ ජන ඇදහිලි හා විශ්වාසය" කියන පොතේ කියවෙන විදියට, අන්තිමේදී භික්ෂූන්ගේ ලේ උරා බොනවා කියලා සිටුතුමත් වැව් බැම්මෙන් පැනලා සියදිවි හානිකර ගත්තාලු.

අයියෝ මගේ වැව බිඳුණාට දෙයියෝවත් නැද්ද මෙරට
හයියෙන් හඬ තලා එවිට පැන නැසුණායි එහඬ වලට
කඩවල පැනලා නැසුනම කඩවර නම යෙදුණි ඔබට
තෙද ඇති දෙවියෙක් මෙලොවට ඇත්තේ දැන් මුළු දෙරණට"

මෙහෙම බැලුවාම මේ කතාවේ සඳහන් වෙන සිටු චරිතය, බලවත් අකුසල කර්ම දෙකකටම සම්මාදන් වුණු කෙනෙක්. ඉවසීම අඩුකම, කිපෙන සුළුකම, දාරක ස්නේහය ගැනවත් තැකීමක් නැති, තද ගතිගුණ තිබුණු කෙනෙක්. ඒ වගේ ලක්ෂණ රාෂියක්ම සෘජුව සහ වක්‍රව දැක්වුවාට පස්සේ වුනත්, කථාව අවසානයේ සිටුතුමා දේවත්වයට පත් කරන්න ඉදිරිපත් වෙලා තියෙන එකෙන් අපට පෙනෙන්නේ සුසන්ධීකරණ න්‍යායේ භාවිතාව.

### පත්තිනි දේවිය

කෝවලන් තමන්ගේ බිරිඳ කණ්ණගී අතහැර දාලා නිළියක් එක්ක ජීවත් වෙන්න යනවා. මේ නාටිකාංගනාව එක්ක විනෝදකාමී ජිවිතයක් ගතකළත් අන්තිමේදී නාස්තිය නිසාම මුදල් සේරම ඉවර වෙනවා. නිළියත් කෝවලන්ගෙන් වෙන් වෙලා යනවා. තමන්ගේ ස්වාමියා ගැන ද්වේෂ නොකරන කණ්ණගී, කෝවලන් ගැනම හිතින් බැඳිලා ඉන්නවා මිසක වෙන ස්වාමියෙක් ගැන හිතන්නේ නෑ. සල්ලියි වස්තුවයි අහිමි වුණාට පස්සේ කෝවලන් ආයෙත් කණ්ණගී ළඟට එනවා. කණ්ණගීත් එයාට සමාව දීලා බොහොම ආදරෙන් පිළි ගන්නවා.

පඬි නුවරට යන මේ දෙන්නාට මුදල් හිඟකම නිසා ගොඩක් කරදරවලට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. කණ්ණගී තමන්ගේ පාසළඹ ගලවලා කෝවලන් අතට දීලා ඒක විකුණලා සල්ලි අරගෙන එන්න කියනවා. මේ අවශ්‍යතාව ඉෂ්ට කර ගන්න කෝවලන් පඬිනුවරට යනවා. ඒත් එහේ ඉන්න කිසිම කෙනෙක් කෝවලන්ව අඳුරන්නේ නෑ. මොකද්දෝ මහා අවාසනාවකට එදාම පඬි රජ්ජුරුවන්ගේ මෙහෙසියගේ පාසළඹත් නැතිවෙලා. පා සළඹක් විකුණ විකුණ නුවර හැමතැනම ඇවිදින මෙ ආගන්තුක මිනිහා නම් පඬි රජුගේ බිසවගේ පා සළඹ හොරකම් කරපු හොරාම තමයි කියලා හිතන මිනිස්සු ඒ ගැන රජ වාසලට ඔත්තුවක් දෙනවා. මේ ඔත්තුවට අනුව අල්ල ගන්න කෝවලන්ව මරණ දණ්ඩනයටත් නියම වෙනවා.

මේ කිසිම දෙයක් ගැන නොදන්න කණ්ණගී තමන්ගේ ආදරණීය ස්වාමියා පරක්කු වෙන්නේ ඇයිද කියලා හිත හිතා ලතවෙනවා. අන්තිමේදී ඇය කෝවලන්ව හොයාගෙන නගරෙට යනවා. කෝවලන්ව මරා දැම්ම ආරංචිය නුවරුන්ගෙන් දැනගන්න කණ්ණගීගේ පුදුමාකාර දුකකින් සහ තරහකින් විලාප දෙන විදිය කාගේත් හිත් කම්පා කරනවා.

කිසිම හෙවිල්ලක්" බැලිල්ලක් නැතුව, අසාධාරණ විදියට තමන්ගේ සැමියාව ඝාතනය කරපු පඬි රජතුමා ගැන ඇතිවුණු අප්‍රමාණ තරහෙන් කණ්ණගී තමන්ගේ වම් පියයුර කඩලා ගහද්දී ඒකෙන් පඬි නුවරම ගිණි ගන්න පටන් ගන්නවා. මුළු රටම ගිණිබත් වෙලා අළු වෙලා යන කොට ළසෝ ගින්නෙන් ගිනිබත් වෙච්ච හදවතත් එක්කම කණ්ණගීත් අවසන් හුස්ම හෙළනවා.

ඒත් මිය ගිය කණ්ණගී පත්තිනි දේවතාව වෙලා දිව්‍ය ලෝකේ උපන්නා කියලයි මිනිස්සු අදහන්නේ. අදටත් සිංහල සමාජය පත්තිනි අම්මා කියන නම පාවිච්චි කරන්නේ "පතිභක්තියෙන් යුතු, පතිවත රකින භාර්යාව" කියන තේරුමෙන්. කණ්ණගීට දේවත්වයක් ආරෝපණය වීමට තරම් ශක්තිමත් බලයක් වුණේ ඇගේ පතිභක්තිය බව ව්‍යංගයෙන් අපිට ගම්‍ය වෙනවා. ඒත් ඉතා විශාල නගරයක් වුණු පඬිරට සහමුලින්ම ගින්නෙන් විනාශයට පත් කරන්න තරම් දරුණු වුණු කෙනෙක්ට දේවාත්මයක් ආරෝපණය කිරීමෙන් අපිට පැහැදිලිව පේන්නේ පත්තිනි පුවත සමගත් සුසන්ධීකරණ න්‍යාය ගැලපී තියෙන බව. සමහර අයගේ විශ්වාසයට අනුව හැම අවුරුදු හතකටම වතාවක් පඬි නුවර ගින්නක් ඇති වෙනවාලු. කුමාරිගේ හිතේ තිබුණු වේදනාව උපරිමයකට ආපු කාලයට මෙහෙම සිද්ධ වෙනවා කියන එකයි මිනිස්සුන්ගේ හැඟීම.

කෙනෙකුගේ හිතේ තියෙන දුකකින් තවත්